"කුඩ්ඩන්", "මත්ලෝලීන්" වැනි යෙදුම් බොහෝ විට අප සමාජය තුළත්, මාධ්‍ය තුළත් භාවිතා වනු දක්නට ලැබේ. කෙසේ නමුත්, මෙම යෙදුම් ඔස්සේ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින්ව සෘණාත්මකව ලේබල් ගත කෙරේ. ඒ අනුව,

1) "කුඩ්ඩන්" වැනි ලේබල්ගත කිරීම් ඔස්සේ හැඳින්වෙන මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් සමාජ කොන් කිරීමකට ලක් වීමත්, පුනරුත්ථාපනයකින් පසුව හෝ ඔවුන්ට යළි සමාජයට එක් වීමට බාධා ඇති වීමත් සිදු නොවන්නේ ද?

2) එසේම, මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු මත්ද්‍රව්‍ය කෙරෙහි දක්වන හුදු ලොල් බවක් නොව වඩාත් සංකීර්ණ කරුණු ගණනාවක් හේතු කොට ගෙන සිදුවන්නක් වේ. එසේ නම්, "මත්ලෝලීන්" වැනි යෙදුමක් ඔස්සේ මත්ද්‍රව්‍ය ඇබ්බැහි වීම පිළිබඳව මෙන්ම මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන්නන් පිළිබඳවද වැරදි අදහසක් සමාජගත නොවන්නේ ද?

3) ඒ අනුව, "කුඩ්ඩන්" හෝ "මත්ලෝලීන්" වැනි යෙදුම් වෙනුවට, "මතට ඇබ්බැහි වූවන්", "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය වෙතැයි ඔබ නොසිතන්නේ ද?

ඔබේ අදහස කුමක්ද?